# ගල්කුලම තලගුරු විහාර පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍රය ආශ්‍රිත ගවේශණයක්

යූ.පී. අජිත් සෝමරත්න[67]

ගල් කුලමතලගුරු විහාරය ආශ්‍රිත පුරාවිද්‍යා ක්ෂේත්‍රය අනුරාධපුර සමයේ විහාරාරාමික පරිසරයක නෂ්ටාවශේෂ පිළිබිඹු කරන උතුරු මැද පළාතේ පිහිටි වැදගත් පුරාවිද්‍යා ස්ථානයක් ලෙස අර්ථකතනය කිරීම යුක්ති සහගත ය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගල්කුලම ප්‍රදේශයට නුදුරින් තත් ක්ෂේත්‍රය ස්ථානගත වෙයි. ගල්කුලම මංසන්ධියට ආසන්න ව මහනුවර යාපනය ප්‍රධාන මාර්ගයේ, නොච්චිකඩුව මංසන්ධියෙන් දකුණට හැරී එම අප්‍රධාන මාර්ගයේ 2.3 කි.මී පමණ ගිය තැන තලගුරු රජමහ විහාරයට ලගාවිය හැකි ය. එහි සිට කිමී 1ක් පමණ නිරිත දිගින් මීටර් 150ක පමණ උන්නතාංශයකින් යුක්ත කඳු ගැටයක පුරාවිද්‍යාත්මක නෂ්ටාවශේෂ විසිරී තිබේ.ක්ෂේත්‍රය ආශ්‍රිත හමුවන කැපී පෙනෙන වාස්තු විද්‍යාත්මක ලක්ෂණ අතර ප්‍රධාන ස්තූප පාදමක්, කඳු වැටියේ නිම්න කලාපයේ තැනින් තැන ඉදිකර තිබෙන්නට ඇතැයි උපකල්පනය කළ හැකි කුඩා ස්තූප ගොඩැලි දෙකක් සහ වර්ග මීටර් 100ක පමණ විහිද ඇති ඔපයක් රහිත ශිලා ස්ථම්භ ද නිරීක්ෂණය කළ හැකි ය. එමෙන් ම ශිලා ජල පිහිලි, ගඩොල්, ගඩොල් ප්‍රාකාර පාදම් සහ ප්‍රධාන කඳු ගැටයේ මෙන් ම ඊට දකුණින් ඇති ගල් තලාවේ උළු කැබලි සහ මැටි බඳුන් කොටස් සුලබ ව හමුවෙයි.තත් පරිසරය නිරීක්ෂණය කිරීමේ දී භූ විෂමතාව ප්‍රයෝජනයට රැගෙන ආරාමික පරිසරය සකස් කර ඇති ආකාරය හඳුනාගත හැකි ය. ජලවහනය සම්බන්ධ වැඩි වැදගත්කමක් දී ඇති බව භූමිය නිරීක්ෂණය කිරීමේදී පැහැදිලි වෙයි.එහි ඇති ශිලා ස්ථම්භ රළුව සකස් කර ඇති අතර ඒවා විසිරී ඇති ආකාරය අනුව ගොඩනැගිලි ලක්ෂණ ද විශද කරයි. කෙසේ වුවද මෙම පුරාවිද්‍යා ස්ථානය මෑත කාලයේදී විනාශයට ලක්කර ඇති අතර ක්‍රමවත් පුරාවිද්‍යාත්මක මැදිහත්වීමක් තවමත් මෙම ස්ථානයට නොලැබී ඇත. මනා ගවේශණයක් සහ කැණීමක් සිදුකර වාර්තා කිරීම මගින් නිර්මිත පරිසරය සම්බන්ධ වැදගත් අර්ථකතන වලට එළඹීමට හැකි බව සිතිය හැකි ය. මෙම ක්ෂේත්‍රය පිළිබඳ ව තවදුරටත් අධ්‍යයනය කිරීමට අපේක්ෂා කරන අතර ක්ෂේත්‍රය සම්බන්ධ මූලික විස්තරයක් මෙම අධ්‍යයනයෙන් ඉදිරිපත් කෙරේ.

[67] පුරාවිද්‍යා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.